# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 27 දරන
# ශ්‍රීමත් ජෝන් කොතලාවල
# රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජූලි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 27 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 42/86

**1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :--

1. මේ පනත 1988 අංක 27 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1981 අංක 68 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (මෙහි මින් මතු 'අභ්‍යාස ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන 'ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු විශ්ව විද්‍යාලයක් පිහිටුවනු ලැබේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අඅ) රාජ්‍ය ආරක්ෂාව සහ යුද හමුදා කළමනාකරණය සඳහා අදාළ වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා සහ උපදෙස් සැපයීම ;

(අආ) එවැනි අධ්‍යයන පාඨමාලා හැදෑරීම සහ උපදෙස් පිළිපැදීම සඳහා කැඩෙට් නිලධරයන් සහ නිලධරයන් ඇතුළු කර ගැනීම ;

(අඇ) එවැනි අධ්‍යයන අංශයන්හි ප්‍රවීණතාවක් ලැබූ කැඩෙට් නිලධරයන් සහ නිලධරයන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම ;

(අඈ) රාජ්‍ය ආරක්ෂාව සහ යුද හමුදා කළමනාකරණය සඳහා අදාළ වන අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා රජයේ නිලධරයන් ඇතුළු කර ගැනීම සහ එවැනි අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් ප්‍රවීණතාවක් ලැබූ නිලධරයන් නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේද ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අඅ) කැඩෙට් නිලධාරී සහ නිලධාරී අභ්‍යාසයන් සඳහා අදාළ වන යම් විෂයයන් පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ ඒ අධ්‍යයන කටයුතු වල දී උපදෙස් දීම;

(අආ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන්ට මූලික සේවා අභ්‍යාසයක් ලබා දීම;

(අඇ) රාජ්‍ය ආරක්ෂාවට සහ යුද හමුදා කළමනාකරණයට අදාළ වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා සහ උපදෙස් සැපයීම;

(අඈ) එවැනි අධ්‍යයන පාඨමාලා හැදෑරීම සහ උපදෙස් පිළිපැදීම සඳහා කැඩෙට් නිලධරයන් සහ නිලධරයන් ඇතුළු කර ගැනීම;

(අඉ) එවැනි අධ්‍යයන අංශයන්හි ප්‍රවීණතාවක් ලැබූ කැඩෙට් නිලධරයන් සහ නිලධරයන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(අඊ) රාජ්‍ය ආරක්ෂාවට සහ යුද හමුදා කළමනාකරණයට අදාළ වන අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා රජයේ නිලධරයන් ඇතුළු කර ගැනීම සහ එවැනි අධ්‍යයන කට යුතු සම්බන්ධයෙන් ප්‍රවීණතාවක් ලැබූ නිලධරයන් නිශ්චය කර ගැනීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම;

(අඋ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 128 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, ඒ ගැන නොතකා, මෙම අභ්‍යාස ආයතනයේ එවැනි අධ්‍යයන අංශයන්හි අධ්‍යයන පාඨමාලා හදාරා එවැනි විභාගවලින් සමත් වූ කැඩෙට් නිලධරයන් හා නිලධරයන් හා රජයේ නිලධරයන් වෙත උපාධි, අභිධාන පත්‍ර හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම හා පිරිනැමීම;

(අඌ) කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තැනැත්තන් වෙත සම්මාන උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම;

(අඑ) මෙම අභ්‍යාස ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම;

(අඒ) මෙම අභ්‍යාස ආයතනයේ කාර්ය සඳහා මහාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු සහ වෙනත් තනතුරු පිහිටුවීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් මෙසේ සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම, පහත සඳහන් ඡේදය ඊට ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) රාජ්‍ය ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ (මෙහි මින්මතු "අතිරේක ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අතිරේක ලේකම්වරයා ; සහ

(3) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) රාජ්‍ය ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, ඔහු නොපැමිණි අවස්ථාවක, අතිරේක ලේකම්වරයා මූලාසනය දැරිය යුතුය ;

(3) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයන් පස් දෙනකු සිටිය යුතු අතර, යටත් පිරිසෙයින් ඔවුනතුරෙන් සාමාජිකයන් දෙදෙනෙකු හෝ සන්නද්ධ හමුදාවල අණ දෙන නිලධරයන් විය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට හා පාලනයට යටත්ව" යන වචන වෙනුවට, "මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට හා පාලනයට සහ 7අ වගන්තියේ විධිවිධානවලට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, එය ඒ ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 7අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අධ්‍යයන මණ්ඩලය.

7අ. (1) ශාස්ත්‍රීය හා රාජ්‍ය ආරක්ෂක අධ්‍යයනයන්ට අදාළ වන අභ්‍යාස ආයතනයේ කටයුතු, කළමනාකාර මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යයන මණ්ඩලයේ මෙහෙයවීම යටතට පත් කළ යුතු ය.

(2) අධ්‍යයන මණ්ඩලය විසින්, මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට හා පාලනයට යටත්ව, අභ්‍යාස ආයතනයේ උපදෙස්, අධ්‍යයන පාඨමාලා, පරීක්ෂණ හා විභාග මෙහෙයවීම සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කරන අතර, එය ඒ ප්‍රඥප්තියේ 10අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :—

" ගිණුම් විගණනය කිරීම.

**10 අ.** (1) අභ්‍යාස ආයතනයේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් හා වෙනත් සියලුම ගණුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙනයාමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මෙම අභ්‍යාස ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු වන්නේය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) හා (ආ) ඡේදයන් අත් හැරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 24අ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරන අතර, එය ඒ ප්‍රඥප්තියේ 24අ වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය :—

" 1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවන බව.

**24අ.** 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන මේ පනත මගින් පිහිටුවනු ලැබූ අභ්‍යාස ආයතනයට හෝ ඒ සම්බන්ධයෙන් හෝ අදාළ නොවන්නේය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් යෙදුම් තේරුම් ගැනීම.

**11.** මේ පනතේ උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දැක්වෙන සෑම වගන්තියකම, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපී සටහනෙහි සඳහන් කර ඇති යෙදුම් සඳහා වූ යොමුව, ඒ උපලේඛනයේ III වන තීරුවේ අනුරූපී සටහනෙහි සඳහන් කර ඇති යෙදුම් සඳහා වූ යොමුවක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තිය සහ වෙනත් ලිඛිත නීතියක් සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ යම් ලිඛිත නීතියක නැතහොත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ නිකුත් කරන ලද, සම්පාදිත නියමිත හෝ බලය පවරනු ලැබූ යම් දැන්වීමක, සන්දේශයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක යම් විධිවිධානයක " ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල " හෝ " ශ්‍රීමත් ජෝන්

කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය" යන වචන යෙදෙන කිනම් තැනක වුවද, ඒ වචන වෙනුවට, පිළිවෙලින් "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල" සහ "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය" යන වචන ආදේශ කළ යුතු ය.

**කොන්ත්‍රාත්තු යනාදිය සඳහා ඉතිරි කිරීම.**

13. මේ පනත ආරම්භ කිරීමේ දිනට පෙර, "ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය" විසින් හෝ ඒ නමින් සම්පාදිත, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සෑම කොන්ත්‍රාත්තුවක්ම, ගිවිසුමක්ම හෝ වෙනත් සාධන පත්‍රයක්ම හෝ කවර වූ හෝ ලේඛනයක්ම, මේ පනත ආරම්භ කිරීමේ දිනට හෝ ඊට පසුව, "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය" විසින් හෝ ඒ නමින් සම්පාදනය කරනු ලැබ, නිකුත් කරනු ලැබ හා ලියා අත්සන් කරනු ලැබ ඇති බවට සහ එසේ කරන ලද බවට සලකනු ලැබිය යුතුය.

උපලේඛනය

(11 වන වගන්තිය)

| I වන තීරුව | II වන තීරුව | III වන තීරුව |
|---|---|---|
| ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්ති | | |
| 3 (අ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයා | ... කැඩෙට් නිලධරයා සහ නිලධරයා |
| 3 (ආ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 3 (ඇ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 7 (1) ... | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් හා නිලධරයන් |
| 14 ... | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයා | ... කැඩෙට් නිලධරයන් |
| 15 (2) (ආ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 15 (2) (ඇ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 15 (2) (ඈ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 15 (2) (ඉ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් |
| 19 (ඇ) | ... පෙර පුහුණු කැඩෙට් නිලධරයන් | ... කැඩෙට් නිලධරයන් හා නිලධරයන් |

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.